WORKED.


# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 11,631—1958 දෙසැම්බර් 31 වැනි බදාදා—31.12.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1958 අංක 558**

අ. ආ. කා. අංකය : N. 90/58.

1948වේ අංක 17 දරණ පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 17 (1) වැනි වගන්තිය යටතේ, ලංකා මධ්‍යම බැංකුවේ ආචාර්ය ඩබ්ලිව්. ඇම්. තිලකරත්න මහතා, 1958වේ දෙසැම්බර 23 වැනි දින සිට, පෞද්ගලික ව්‍යාපාරයේ වේතන ආකෘතිය ගැන පරීක්ෂාකර වාර්තා කිරීමේ කොමිෂන් සභාවෙහි ලේකම් වශයෙන්, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, පත්කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ.
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 දෙසැම්බර 29 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය.

---

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංකය : N. 84/57.

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂමෙහි සභාපති රාජනීතිඥ සී. නාගලිංගම් මහතාගේ අභාවයෙන් ඇතිවූ පුරප්පාඩුවට, 1948 වේ අංක 17 දරණ පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2, 3, සහ 5 වැනි වගන්තීන් යටතේ, විලියම්. ඒ. පෙරේරා මහතා සභාපති ලෙසත්, සී.බී.ඊ. නාමධාරී සී. කුමාරස්වාමි මහතා සමාජිකයෙකු වශයෙනුත්, එම කොමිෂමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, පත්කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 දෙසැම්බර 26 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය.

---


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

3981—ජේ. ඇන්. ආර් 27415—3,620 (12/58)